# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2306/75 – 2022 නොවැම්බර් 18 වැනි සිකුරාදා – 2022.11.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2013 අප්‍රේල් මස 26 වැනි දින අංක 1807/22 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2013 අංක 110 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 වන උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/LRB/22.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරීගේ අංකය: WGSWD&EIP/ACQ/KB/06.

2022 ඔක්තෝබර් මස 05 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 535 B, දිවුල්පිටිය බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, දිවුල්පිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක CO/DSO/2017/553 හා 2020.06.09 දිනැති අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

**01. කැබලි අක්ෂර ‘A’ – පිටකොටුව කුඹුර හෙවත් මැටිවල කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0400**

උතුරට: එම්. ඩී. චමින්ද නෝනිස් හිමිකම් කියන ගොවිකම් පෙදෙසේ වරි. අංක 219/35 A දරන ඉඩම, හිමිකම් කියන අය සොයාගත නොහැකි ගොවිකම් පෙදෙසේ වරි. අංක 21/49 දරන ඉඩම, හිමිකම් කියන අය සොයාගත නොහැකි ගොවිකම් පෙදෙසේ වරි. අංක 28/48 දරන ඉඩම සහ එච්. එම්. චන්ද්‍රලතා හිමිකම් කියන ගොවිකම් පෙදෙසේ වරි. අංක 21/46 දරන ඉඩම; නැගෙනහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි ගොවිකම් පෙදෙසේ වරි. අංක 28/48 දරන ඉඩම, එච්. එම්. චන්ද්‍රලතා හිමිකම් කියන ගොවිකම් පෙදෙසේ වරි. අංක 21/46 දරන ඉඩම සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ ඇවිදින මංතීරුව; බටහිරට: ඇවිදින මංතීරුව සහ එම්. ඩී. චමින්ද නෝනිස් හිමිකම් කියන ගොවිකම් පෙදෙසේ වරි. අංක 219/35 A දරන ඉඩම.

EOG 11 – 0209

1A – G 38107 – 16 (2022/11)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*